## තොරතුරු සටහන

## ජලය මගින් ශ්‍රී ලංකාවේ ගම්මාන වලට නව ආරම්භයක්

ජලය සුවතාවය සහ සෞඛ්‍යය යන තුන අවියෝජනීය ලෙස එකිනෙක හා සමග බැඳී පවතී. මේ මූලික පහසුකම් නොලැබීම ඉතා දැඩි ලෙස බලපාන්නේ සිය ජීවනෝපායය සඳහා කෘෂිකර්මය, සත්ව පාලනය සහ වෙළඳ බෝග වර්ග වගාකිරීමත් කෙරෙහි විශ්වාසය තබා සිටින ගැමි ජනකණ්ඩායම් වලටයි. ජල සම්පත අඩුවේගෙන යන විට, ජල අයිතියත්, සමාන ලෙස ජලය ලබාගැනීමේ අයිතියත් ශ්‍රී ලංකාවේ ගැමියන්ට මුහුණපාන්නට සිදුවී තිබෙන ප්‍රබලතම ප්‍රශ්න බවට පත්ව ඇත්තේය. 2010 වන විට, මේ රටේ මුළු මහත් ජනකායටම පවිත්‍ර පානීය ජලයත් අවශ්‍ය තරමට සුවතාවයත් ලබාදෙන්නට ශ්‍රී ලංකා රජය කැපවී සිටී. අත්‍යවශ්‍ය ජලපහසුව සහ සුවතා පහසුවත් ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ ජනකණ්ඩායම් වලට ජල පහසුව සහ සුවතා පහසුවත් සම්පාදනය කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ දෙවන ව්‍යාපෘතියට, ලෝක බැංකුව සහාය සපයන්නේය. තිරසාර ජල සම්පාදන ක්‍රමත් සුවතා සම්පාදන ක්‍රමත් පවත්වාගෙන යන්නට මධ්‍යම ආණ්ඩුව සහ පළාත් පරිපාලන ආයතනත් සතු ශක්තිය තව තවත් ප්‍රබල කරන්නටද ලෝක බැංකුව සහාය සපයන්නේය.

ග්‍රාම සංවර්ධනය සඳහා සහ දිළිඳුකම අවම කිරීමත් සඳහා, ජල සම්පත දියුණු කිරීම සහ ජලය පරිපාලනය කිරීමත් අත්‍යවශ්‍ය හෙයින් ඒ දෙක ලංකාවේ ඉහල ප්‍රමුඛතාවයක් ලබන්නේය. ගැමි පෙදෙස් වල සෞඛ්‍යය සහ යහජීවනය දියුණු කිරීමේ අරමුණින් මේ ව්‍යාපෘතිය සකස්කොට තිබෙන්නේ සිය ජල සම්පාදන සහ සුවතා සම්පාදන ක්‍රම සැලසුම් කරන්නට, ක්‍රියාවේ යොදවන්නට සහ පාලනය කරන්නටත් ප්‍රාදේශික ජන කණ්ඩායම් වලට බලය පැවරෙන ආකාරයෙනි.

දැනට මේ සේවය අර්බුද අවස්ථාවක පවතී. නළ ජල පහසුව ලැබෙන්නේ ගෙවල් දහයකින් එකකට පමණකි. ජනගහණයෙන් සෑම පස්දෙනෙකුගෙන්ම එක්කෙනෙක්, පානීය ජලය ලබාගැනීම සඳහා විශ්වාසය තබා සිටින්නේ ගංගා

සහ ඇළ - දොළ කෙරෙහිය. ගම්වල සහ සුළු නගර වල ජනගහණයෙන් සීයට තිහකට පෞද්ගලික මට්ටමෙන් පවිත්‍ර පානීය ජලය ලබාගත හැකිවේ. ගම්වල සහ සුළු නගරවල ජනගහණයෙන් සීයට තිහකට පමණකටම සෞඛ්‍යයට හිතැති වැසිකිළි පහසුව ලබා ගත නොහෙන හෙයින් සුවතා තත්වයද එසේම දුර්වලය.

ගෙදර දොර අවශ්‍යතා සඳහාත් කෘෂිකර්මය සඳහාත් කාර්මික හා වාණිජ ව්‍යාපාර සඳහාත්, මේ දුර්ලභ සම්පත සඳහා, එන්ට එන්ටම අධික වන තරගයක් වෙසෙසින්ම ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ පවත්නා හෙයින්, ජල සම්පත අඩුවෙමින් පවතී. එපමණක් නොවේ. ජල සම්පත දූෂණයට පාත්‍රවීම නිසාත්, ජලයේ ගුණාත්මක බව නිතිපතා විශ්වාසවන්ත ආකාරයෙන් පරීක්ෂා නොකෙරෙන නිසාත්, ශ්‍රී ලංකාවේ ගැමි පෙදෙස්වල සම්ප්‍රදායික ජල සම්පත් සම්පාදක මාර්ග එන්ට එන්ටම අධික වශයෙන් අන්තරායකාරි වේ. මේ දේශයේ සෞඛ්‍ය තත්වය පිරිහී යෑම ගැන වගකිවයුතු වන්නේ සම්ප්‍රදායික ජල සම්පත් සම්පාදක මාර්ග එන්ට එන්ටම අඩුවීම සහ ඒවයේ ගුණාත්මක ගතිය මෙසේ පිරිහීයෑමත් විය හැකිය. වෙසෙසින්ම කුඩා දරුවන් අතර පවත්නා බෝවන රෝග සහ පරපෝෂිත රෝග පිළිබඳ ප්‍රධාන වාහකයන් වශයෙන් සාමාන්‍යයෙන් නම් කළ හැක්කේ අනිසි ලෙස සකස් කළ වැසිකිළි වලවල් සහ බැක්ටීරියා නිසා දූෂිත වූ ජලයත්ය.

මේ ව්‍යාපෘති සංවර්ධනයෙහි අරමුණ වන්නේ සේවය ලබන ස්ථාන අධික කිරීමත් ගැමි ප්‍රජාව තුළ ජල සම්පාදන සහ සුවතා පහසුකම් අර්ථවත් ලෙස සහ තිරසාර ලෙස දියුණු කිරීමත්ය. මේ ව්‍යාපෘතිය ක්‍රියාවේ යොදවනු ලබන්නේ විමධ්‍යගත ක්‍රමයෙන් පළාත් සභා සහ ප්‍රාදේශීය සභා මගිනි. තමන්ගේ ජල පහසුව සහ සුවතා පහසුව සඳහා කෙරෙන ආයෝජන, තමන් විසින්ම පාලනය කොටගත හැකිවනු පිණිස ඒවා සැලසුම් කිරීමේ, ක්‍රියාවේ යෙදවීමේ සහ පරිපාලනය කිරීමේත් වගකීම ප්‍රජාවට පැවරෙයි.

සේවා සම්පාදනය විමධ්‍යගත කිරීමේ ක්‍රමය මගින්, මේ ව්‍යාපෘතිය විසින්, රජයේ අංශත්‍රයක ශක්තිය වර්ධනය කරනු ලැබේ. ඒ අංශ තුන නම් මධ්‍යම

ආණ්ඩුව, පළාත් ආණ්ඩුව, සහ ප්‍රාදේශික පරිපාලනයත්ය. ගැමි පෙදෙස් උදෙසා කෙරෙන සෙසු ආයෝජනයන්හිදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේලා අනුගමනය කළ හැකි අර්ථවත් විකල්ප, මේ ක්‍රමය විසින් ප්‍රදර්ශනය කෙරෙන්නේය.

දැනුම අඩුකම නිසාත්, හොඳ සෞඛ්‍යයෙහි ප්‍රතිඵල ගැන පවත්නා අඩු අවබෝධය නිසාත්, සෞඛ්‍ය තත්වය පිරිහීමේ ප්‍රශ්නය නිරාකරණය කරනු පිණිස, ස්වස්ථතාවය, ජල සම්පත් ආරක්ෂා කිරීම සහ පරිසරය සුරැකීම ගැනත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙයි.

ජලයෙහි ගුණාත්මක බව පිළිබඳ නිරන්තර අධීක්ෂණ, මේ ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කෙරේ. ළිං වලත්, භූගත ජලයේත්, මතුපිට ජලයේත් පවත්නා ද්‍රව්‍යමය දූෂණ සහ රසායනික දූෂණ පරීක්ෂා කිරීමත් මේ අධීක්ෂණයට අයත්ය. දූෂණාංශු හඳුනා ගැනීම ගැනත් පහසුවෙන් භාවිත කළ හැකි උපකරණ මගින් නිතිපතා ජල නියැදි පරීක්ෂා කිරීම ගැනත් ජන කණ්ඩායමේ සමාජිකයන්ට පුහුණුවක් ලබාදීමද මේ අධීක්ෂණයේ අංග වෙති.

හුදෙක්ම දිළිඳු අය පමණක් ඉලක්ක කොට ගනු ලබන්නේ නැති වුවද මේ ව්‍යාපෘතියෙන් ප්‍රධාන වශයෙන්ම සෙත ලබන්නේ දිළිඳු අයයි. දිළිඳුකමේ ප්‍රමාණයත්, ජලයේ පවිත්‍රතාවයේ තත්වයත් අතර ඉතා ප්‍රබල සම්බන්ධතාවයක් පවතී. ශ්‍රී ලංකාවේ මේ ව්‍යාපෘතියට ඉලක්කවන ගැමි පෙදෙස්වල ශ්‍රී ලංකාවේ දිළිඳු අයගෙන් සීයට 90ක් පමණ වාසය කරති.

නාගරික සංවර්ධනය සහ නිවාස ඉදිකිරීමේ අමාත්‍යාංශය විසින් ජන කණ්ඩායම් වලට ජල පහසුව සහ සුවතා පහසුවත් සම්පාදනය කිරීමේ ව්‍යාපෘතිය පළමුවෙන් ක්‍රියාත්මක කරන ලද්දේ 1993 වසරේදීය. එය ක්‍රියාත්මක කරන ලදදේ බදුල්ල, මාතර සහ රත්නපුර දිස්ත්‍රික්ක වලයි. ජල පාරිභෝගිකයන් වන වෙසෙසින්ම මූලික ජල රැස් කරන්නන් වන- කාන්තාවන් ජල සම්පාදන ක්‍රම සංවර්ධනය කිරීමේ හැම අංශයකටම සහභාගිවීම හේතු කොට ගෙන, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත්, එය මෙහෙයවීමත්, එසේම එය

තිරසාර ලෙස නඩත්තු කොටගෙන යෑමත්, දියුණුවන බව ව්‍යාපෘතිය ඇගයීමේදී අනාවරණය වූයේය. මෙහි පූර්ණ වාර්තාව බලන්න (ජන කණ්ඩායම් වලට ජල සම්පාදනය සහ සුවතා පහසුව සැලසීමේ ව්‍යාපාතිය : බලපෑම ඇගයීමේ වාර්තාව අංක 18113)

ව්‍යාපෘතියේ මුළු වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන පණස් පහකි. මේ මුදලින් ඩොලර් මිලියන 33.7ක් ලෝක බැංකුව විසින් ඍජුවම කෙරෙන ප්‍රදානයක් වශයෙන් සම්පාදනය කෙරේ. ඒ නිසා මෙය ගැමි පෙදෙස්වලට ජල සම්පාදනය සහ සුවතා පහසුව සම්පාදනය කිරීමත් සඳහා ආසියාවේ කවර රටකට හෝ ලෝක බැංකුව විසින් පිරිනමන ලද විශාලතම ප්‍රදානය වේ